අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. ED/05/67/28/02(IV)

ඔබේ අංකය / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2022.02.16

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ විදුහල්පතිවරුන් /

පියාධිපතිවරුන්/ ගුරු විදුහල්පතිවරුන්/

ගුරුමධ්‍යස්ථාන කළමනාකාරවරුන්,

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - **2022**

ඉහත කරුණු සම්බන්ධව මාගේ සමාංක හා **2022.01.07** දිනැති ලිපිය මගින් ඉදිරිපත් කළ **2022** වාර්ෂික ස්ථාන මාරු නියෝග හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **1** වැනි කාණ්ඩයේ **XVIII** වැනි පරිච්ඡේදයේ **210** සහ **211** වගන්ති අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි. මෙමගින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ඉහත සඳහන් නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා **2022.01.07** දිනැති ලිපිය මගින් යෝජිත **2022** වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

03. ඉහත සඳහන් නියමයන්ට යටත්ව, ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය පිළිබඳව වෙනත් දිනයන් සඳහන් කර නොමැති සියලුම ස්ථාන මාරුවීම් **2022-03-02** දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධරයන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරී භාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් **2022.03.01** දින සේවයෙන් පසු මුදාහැරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු ලැබූ නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී ඇදහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති සේවා ස්ථානයේ ප්‍රධානියා වීසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති **217** වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය

05. ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **XX** පරිච්ඡේදයේ **231** වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. ඒ සඳහා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කර ඇති ආකෘති පත්‍ර

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

අංක - 5A සම්පූර්ණ කර 2022- 03-18 දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.



මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ. ගැ. සැ.
2. සියළුම අතිරේක ලේකම්වරු
3. ප්‍රධාන මූල්‍ය නිලධාරී
4. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කරු. අවශ්‍ය කටයුතු සඳහා
5. ජාතික පාසල් අධ්‍යක්ෂ
6. විද්‍යාපීඨ කොමසාරිස්
7. අධ්‍යාපන අධ්‍යක්ෂ (ක්‍රීඩා)